## දකුණු පළාත් සභාව

# දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය

**(ද.ප.ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය)**

## "ස්ථානභාර නිලධාරී" තනතුර සඳහා බඳවා ගැනීම

දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය සඳහා මධ්‍යස්ථාන භාරව කටයුතු කිරීම උදෙසා ස්ථානභාර නිලධාරීවරයකු බඳවා ගැනීම වෙනුවෙන් පහත සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. අධ්‍යාපන සුදුසුකම්**

**1.1 බාහිර අයදුම්කරුවන්**

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ,
   - I. සිංහල
   - II. ගණිතය
   - III. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

**1.2 අතිරේක සුදුසුකම්**

1. දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් හෝ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පවත්වනු ලබන වෘත්තීය පුහුණු (වඩු කාර්මික, ලුහු ඉංජිනේරු ,දැව කැටයම්, උද්‍යාන අලංකරණ) පාඨමාලාවක් හදාරා තිබීම.

**1.3 අභ්‍යන්තර අයදුම්කරුවන්**

අ. ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, ශිල්පීය සේවා ගණයන්හි පහත (ආ) සහ (ඇ) සුදුසුකම් ඇති සේවකයන්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

ආ. සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

ඇ. නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**පොදු කොන්දේසි**

**2. වයස:** අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.)

**3 වෙනත් :**
- I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**4. වැටුප් කේතය හා පරිමාණය :**

(MA 1-1) 27,910- 300X10 - 350X7 -495X4 - 660X20 - 48,540 (කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 මත පදනම්ව) මූලික වැටුප වන රු.27,910/- 2020.01.01 දින සිට ගෙවනු ලැබේ. 2020.01.01 දිනට ආරම්භක වැටුප් තලය රු. 27,910 වේ. මූලික වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**5. පත්වීමේ ස්වභාවය :** ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත වේ.

**6. තෝරාගැනීමේ ක්‍රමවේදය :** විවෘත තරග විභාගයක් හා /හෝ පත්වීම් බලධරයා විසින් පත් කරන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

සම්පූර්ණ විස්තර සහිතව ඔබ විසින් සකස් කරන ලද ජීව දත්ත සහිත අයදුම්පත් (සහතික කරන ලද සහතිකවල ඡායා පිටපත්ද සහිතව) 2020/10/05 දින හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි "සභාපති, ද.ප. කාර්මික සංවර්ධන අධිකාරිය, අංක 349 ½ , මාතර පාර, කටුගොඩ, ගාල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ. ඉහත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ හා නියමිත පරිදි ඉදිරිපත් නොකරන හා අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.


**සභාපති,**

**ද.ප. කාර්මික සංවර්ධන අධිකාරිය,**

**අංක 349 1/2 , මාතර පාර, කටුගොඩ, ගාල්ල**

**091-2226296/091-3789290**